සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

43 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

Second Term Test - Grade 12 - 2020

විභාග අංකය .............................. ක්‍රිස්තු ධර්මය I කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයකට 1,2,3,4,5 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ලකුණු කරන්න.**

01. පංච පුස්තකයේ අඩංගු වන්නේ,
1. කුරානය.
2. පුරාණ ගිවිසුමය.
3. ශුද්ධ බයිබලයේ පළමු පොත් පහය.
4. ආබ්‍රහම් තුමා පිළිබඳ පොත්ය.
5. ගැලවීමේ ඉතිහාස කථාය.

02. පංච පුස්තකයේ ඇතුළත් වන පුරාණ ගිවිසුමේ කේන්ද්‍රීය සිද්ධිය වන්නේ,
1. මැවීමේ පළමු කතාව
2. මැවීමේ දෙවන කතාව
3. ජුෂියා රජු ව්‍යවස්ථාව සොයා ගැනීම.
4. එස්රා ව්‍යවස්ථාව යළි කියවීම.
5. ටෝරා

03. පංච පුස්තකය හැඳින්වීම සඳහා හෙබ්‍රෙව් භාෂාවෙන් භාවිත වන වචනයේ අර්ථය, ,
1. ගැලවීම/මාර්ගය
2.''ව්‍යවස්ථාව/ඉගැන්වීම
3. රුස්වීම /හමුවීම
4. ඉගෙනගැනීම/පාඩම් කිරීම
5. දර්ශනය/අත්දැකීම

04. බයිබලයේ පසුබිම ගැන ගැඹුරු විමර්ශනයක යෙදුණු බයිබල් විශාරදයකු නොවන්නේ
1. එච්. ග්‍රාෆ්,
2. ජුලියස් වෙල්හවුසන්,
3. ද වෙට්ට
4. එච්.ක්වෙන්
5. ප්ලේනි.

05. ජෙත්‍රෝ, ,සීනයි යන වචන වෙනුවට බයිබලය පාවිච්චි කරන වෙනත් වචන වන්නේ,
1. රගුවෙල් / හොරෙබ්
2. හෙරොබ් /ආශේර්
3. රාගවන් /හොනට්
4. අභියාන්/හොරෙන්
5. හේබ්‍රෝන් /සකරියස්

06. මිනිසා මවනු ලබන්නේ ඒදන් උයන තුළ නොව ඉන් පිටත ය. ඉන්පසු ඔහු ඒදන උයන තුළ පිහිටවූ සේක. (උත්පත්ති 2:8). මෙමගින් පෙන්නුම් කරන්නෙ
1. මිනිසාට ලැබිය යුතු ප්‍රමාණයට වඩා දෙවියන් වහන්සේ ඔහුට දී ඇති බව ය
2. මිනිසාගේ ආහාරය පිණිසය
3. ඔවුන් සශ්‍රීක රටකට ගෙන ගිය බව පෙන්වීමටය
4. ඔවුන්ට සමාව දුන් බවය
5. ඔවුන් එයට අයිති නැති බවය

07. ''හොඳ නරක'' දැන ගැනීම යන්නෙන් අදහස් කරන්නේ,
1. පාපයේ හානිය
2. සමාව දීමේ කරුණාව
3. අඳුරු බලවේග
4. වැඩිවියට පත්වූ බව
5. දැන ගැනීමේ පූර්ණත්වය

08. ඊශ්‍රායෙල් ජනයා ප්‍රසිද්ධියේ දිවුරවා තිබුණු ප්‍රකාර මෝසෙස් තුමා විසින් කානාන් වෙත ගෙන ගියේ
1.ජෝශෙප්ගේ ඇටකටු 2.ජාකොබ්ගේ ඇටකටු 3.ඒසව්ගේ ඇටකටු
4.ජෙත්රෝගේ ඇටකටු 5. ඊසාක්ගේ ඇටකටු

09. දෙවියන් වහන්සේ ඉශ්රායෙල් ජනයා සමග වැඩ සිටීමේ සලකුණක් ලෙස ද මඟ පෙන්වීමේ සලකුණක් ලෙස සැලකෙන්නේ,
1.දේදුන්න 2. චර්ම ඡේදනය 3. ගිනි ටැඹ හා වලාකුළ 4. ගිනිගත් පඳුර 5. රන්වස්සා

10. සමිඳාණන් වහන්සේට විරුද්ධව ඊශ්‍රායෙල් ජනතාව කළ නිර්මාණය වන්නේ,
1.දේදුන්න 2. ගිවිසුම් කරඬුව, 3. රන්වස්සා 4. ශුද්ධ කූඩාරම 5. ගිනි ටැඹ හා වලාකුළ

11. ඉශ්රායෙල් ජනයාට....නම් පාළු රයේ දී බීමට ජලය නොමැතිවිය,
1.ෂරෝන් 2.කුම්රාන් 3.ලෙබනන් 4.නෙගෙබ් 5.ශීන්

12. නික්මයාම ගමනේ දී ඉශ්රායෙල් ජනයා........ගේ ආක්‍රමණයට ගොදුරුවිය,
1.ජෙබුසිවරු. 2. අමලෙක්වරු 3. කානානිවරු 4. මිදියන්වරු 5. සදුසිවරු

13. "ගිවිසුම" යන්නට හෙබ්‍රෙව් වචනය?
1. බරීත් 2 සෙසොම් 3. බාරාක් 4. බසීර් 5. සලෝම්

14. හොසියා යන්නෙහි අර්ථය වන්නේ, ,
1. සමිඳාණන් වහන්සේ ගලවන සේක 2. සමිඳාණන් වහන්සේ උසස් කළ සේක
3. සමිඳාණන් වහන්සේ ස්ථාපිත කළ සේක 4.'සමිඳාණන් ඔබ මුදා ගන්නා සේක
5. නව නායකයෙක් බිහිවන සේක

15. පහත සඳහන් දිවැසිවරු අතරින් පැරණි දිවැසිවරු නොවන්නේ,
A . හග්ගයි B . අබියා C -ඔබදියා D . නාහුම් E . හුල්දා
1. ABC 2. BCD 3. BDE 4. ABE 5. ACD

16. සම්පත සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය වන්නේ .
1.සෙගුල්ලාහ් 2.නබී 3. සාකාර් 4.කොහෙන් 5.නසාර්

17. ජුදා ජනතාවගේ බලාපොරොත්තුවේ කේන්ද්‍රය වූයේ
1.මෙසියස් 2.ගිවිසුම 3.විප්‍රවාසය 4.නිවහල්රාජ්‍යයක් 5.දේවමාලිගාව

18. පළමු වන මෙසියානික දිවැස් වැකිය හා සම්බන්ධ දිවැසිවරයා හා රජතුමා
1. යෙසායා /දාවිත් 2. එලියා/සලමොන් 3. නාතාන් /දාවිත්
4. ආමොස් /සාවුල් 5. සාමුවෙල්/සාවුල්

19. යුක්තිය හා විශ්වාසවන්තකම මත පදනම්වන මෙසියස් වහන්සේගේ රාජ්‍යය, සාමයේ රාජ්‍යයකි. එහෙයින් මිනිසා හා සත්වයා අතර ද සත්වයන් එකිනෙකා අතර ද සාමකාමිත්වය රජ කරයි. "වෘකයා බැටළුවා සමග වාසයකරන්නේ ය...... කිරිදරුවා නාගයාගේ තුඹස පිට සෙල්ලම්කරන්නේ ය...ප්‍රකාශ කළ දිවැසිවරයා.
1.යෙසායා 2.එලියා 3.නාතාන් 4.ආමොස් 5.සෙකරියා

20. ක්‍රි. පූ. 701 දී ජෙරුසලම, අසිරියානු සෙනාකෙරීබ් රජුගේ ආක්‍රමණයට ලක් වූ පසු ඇතිවූ අසරණ, බලාපොරොත්තු රහිත තත්ත්වය හමුවේ නව බලාපොරොත්තුවක් ඇති කළ දිවැසිවරයා
1.යෙසායා 2.මීකා 3.නාතාන් 4.ආමොස් 5.සෙකරියා

21. සීසර්ගේ රූපය නිසා පලස්තීන වැසියන් ප්‍රතික්ෂේප කළ කාසි වර්ගය වූයේ,
1. ශෙකෙල් 2. මිල්ල 3. ග්‍රීක ඩ්‍රැග්මා 4. රෝම ඩිනාර් 5. යූරෝ

22. දෙවිඳුන්ට ළං වීමටත්, දේව මන්දිරයෙහි විශේෂ ලෙස විසීමට වරම් ලද පිරිසක් වන්නේ
1. සෙගුල්ලාහ් 2.නබී 3. සාකාර් 4.කොහෙන් 5. නසාර්

23. ''මම්ලෙකෙට් කොහෙනීම්'' යන්නෙහි අර්ථය වන්නේ,
1. සුභ ආරංචිය 2. දිවැසි ඉගැන්වීම 3. ශුද්ධ සෙනඟ
4. පූජක රාජ්‍යයක් 5. දෙවියන් වහන්සේගේ සම්පත

24. බැබිලෝනියානු විප්‍රවාසයේදී කැඳවූ පළමු දිවැසිවරයා
1.යෙසායා 2.ජෙරමියා 3.එසකියල් 4.ආමොස් 5. සාමුවෙල්

25. ''එම්මානුවෙල්'' යන්න සඳහන් වන ග්‍රන්ථය
1.ජෙරමියා 2.යෙසායා 3,එසකියෙල් 4.බයිබලය 5. ඩිඩාකේ

26. සමාජ සාධාරණත්වයේ දිවැසිවරයා වන්නේ
1.හොසියා 2.යෙසායා 3.ජෙරමියා 4.එසකියෙල් 5. ආමොස්

27. යෙසායා දිවැසිවරයා ඉදිරිපත් කරන ඉගැන්වීම් අතරින් ප්‍රධාන ඉගැන්වීමක් වන දුක්විඳින සේවකයා ගීත අතරින් දාසයාගේ ගීතය ලෙස සැලකෙන්නේ,
1. පළමු ගීතය 2. දෙවන ගීතය 3. තෙවන ගීතය 4. හතරවන ගීතය 5. ප්‍රශංශා ගීය

28. ජෙරමියා දිරිමත් කරන්නේ
1. පොතක් අනුභවයටදීම 2.අඟුරකින් තොල්පිළිස්සීම 3. මුඛය ස්පර්ශ කිරීම
4. සැරයටියේ හාස්කම් බලය 5. අද්භූත සත්ත්වයා

29. සැඟවුණ අසාධාරණත්වය ගැන කථා කළ දිවැසිවරයා වන්නේ
1.හොසියා 2.යෙසායා 3.ජෙරමියා 4.එසකියෙල් 5.ආමොස්

30. ඉශ්‍රායෙල් ජනතාවගේ යාග පූජා දෙවියන් වහන්සේට පිළිකුල් බව ප්‍රකාශ කළ දිවැසිවරු දෙදෙනා වන්නේ,
1.ජෙරමියා හා ආමොස් 2. යෙසායා හා හොසියා 3. යෙසායා හා ආමොස්
4ජෙරමියා හා හොසියා 5 එසකියල් හා හොසියා

31. ''ප්‍රඥාව" යන්නට යෙදුනු හෙබ්‍රෙව් වචනය වන්නේ.
1. හොක්මා 2. මඅට් 3. බරීත් 4. සෙබයිට් 5. විස්ඩම්ඳ

32. සියලු බලැති දෙවියන්ගේ අභිමතය පිළිබිඹු .කළ විශ්වයේ නියමිත සැලැස්ම අනුව දිවි ගෙවීම අයත් වූයේ,
1. හොක්මා ප්‍රඥාවට ය. 2. මඅට් ප්‍රඥාවට ය. 3. බරීත් ප්‍රඥාවට ය.
4. සෙබයිට් ප්‍රඥාවට ය. 5. විනයධරයන්ගේ ප්‍රඥාවට ය.

33. ප්‍රඥා සාහිත්‍යයේ කේන්ද්‍රය කර ගනුයේ,
1. මිනිසා හා යහපත් ජීවිතයක් ගත කිරීම 2. ගිවිසුම් සංකල්පය
3. දේව මාලිගාව හා එහි වන්දනාව 4. ග්‍රීක දර්ශනය
5. රූප වන්දනාව

34. හේබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේදයක් නොවන්නේ
1. පවුල හා ගෝත්‍රික ප්‍රඥාව 2. සලමොන්ගේ ප්‍රඥාව 3. අභිධාර්මික ප්‍රඥාව
4. එදිනෙදා ජීවිතය සම්බන්ධ 5. රාජ්‍ය සභාව හා ප්‍රඥාව

35. පහත සඳහන් ග්‍රන්ථ අතරින් ප්‍රඥා සාහිත්‍යට අයත් ග්‍රන්ථ වන්නේ,
A - ධර්මදේශකයා B- ගීතාවලිය C - තෝබිත් D - විලාප ගී E - ජෝබ්
1. ABC 2. BCD 3. BDE 4. ABE 5. ACD

36. ජනතාවගේ යැඳුම් පොත හා ගී කළඹ ලෙස පිළි ගැනුනේ,
1. විලාප ගී 2. හිතෝපදේශය 3. සේෆර් තෙහෙලීම් 4. ප්‍රේම ගී 5. හොක්මා

37. සාම්ප්‍රදායිකව දාවිත් රජ තුමාට කතෘත්වය පැවරුවද කතෘත්වය පිළිබඳ අවිනිශ්චිත පොත වන්නේ,
1. විලාප ගී 2. හිතෝපදේශය 3. ගීතාවලිය 4. ප්‍රේම ගී 5. නික්මයාම

38. සියොන් ගීත යනු,
1. තුති දීමේ ගීත 2. රාජකීය ගීත 3. වන්දනා ගීත 4. විශ්වාසයේ ගීත 5. ප්‍රඥා ගීත

39. "පරිසි" යන්නෙහි අර්ථය වන්නේ,
1. ශුද්ධ 2. පූජක සහයක 3. කැපවුනු 4. වෙන්ව සිටීම 5. එක්ව සිටීම

40. ධර්මශාලා නොහොත් (සිනගෝග) ආරම්භ වන්නේ,
1.ජේසුස් වහන්සේගේ කාලයේ 2. අසිරියානු අධිරාජ්‍යය සමය
3.පරසියානු අධරාජ්‍ය සමය 4. දාවිත් රජ සමය
5. බැබිලෝනියානු විප්‍රවාස සමය

41. තත් සහිත සංගීත භාණ්ඩයක් උපයෝගී කර ගනිමින් ගැයෙන ගී හැඳින්වෙන්නේ?,
1. විලාප ගී 2. ප්‍රසස්ති 3. තෙහෙලීම් 4. ප්‍රේම ගී 5. ප්‍රඥා ගී

42. සද්දුසිවරු පැවත එන්නේ,
1. ආබ්‍රහම් තුමා ගෙනි 2. නායක පූජකයාගෙනි 3. උත්තම පූජකයාගෙනි
4. බාල් පූජකයන්ගෙනි 5. ශදොක් පූජකයාගෙනි

43. සෙලෙට් වරුන්ගේ නිර්මාතෘ
1. ස්නාවක ජුවාම් ය. 2. ගලීලයේ ජුවාම් ය. 3. ගලීලයේ ජුදාස් ය.
4. ජෙරුසලමේ ජුදාස් ය. 5. ජෙරුසලමේ බරබ්බාස් ය.

44. ජුදා මන්ත්‍රණ සභාවේ සාමාජිකයින් ගණන වන්නේ,
1. හැත්තෑ එකකි 2. හැත්තෑවකි 3. හැත්තෑ දෙකකි 4. හැට දෙකකි 5. හැටකි

45. අනෙක් පොත් අභිබවා යාවේ දෙවියන් වහන්සේ වෙත ඉශ්‍රායෙල් ජනතාවගේ ආකල්පයන්හි පුළුල් බව හා ගැඹුරු බව විදහා පාන ග්‍රන්ථය වන්නේ,
1. විලාප ගී 2. හිතෝපදේශය 3. ගීතාවලිය 4. ප්‍රේම ගී 5. නික්මයාම

46. ආගමික නායකයන් දුගී ජනතාව මත පැටවූ බදු වර්ග දෙක වන්නේ,
1. දේව මාලිගා බද්ද හා ෂෙකෙල් බද්ද 2. දේව මාලිගා බද්ද හා ඉඩම් බද්ද
3. ජල බද්ද වැට් බද්ද 4. රෝම අධිරාජ්‍යයාට ගෙවූ බදු හා දේවමාලිගා බද්ද
5. හෙරොදිට ගෙවූ බදු හා සීසර්ට ගෙවූ බදු

47. සමිදාණන් වහන්සේගේ සිංහාසනාරූඪ මංගල්‍ය පසුබිමෙන් ගීතාවලිය බිහිවී ඇති බව දැක්වූයේ,
1. හර්මන් ගුන්කල් 2. ආතර් වයිසර් 3. සිග්මන් ප්‍රොයිඩ්
4. ආතර් ෆ්ලෙසර් 5. සිග්මන් මොවින්කල්

48. "සිනගෝගය" යන්නෙහි අරුත
1. දයාව 2. රැස්වීම 3. දේශනා කිරිම 4. ඉගැන්වීම 5. සභා මණ්ඩපය

49. රෝම අධිරාජ්‍යයාට බදුගෙවීමට තරයේ විරුද්ධ වූ පිරිස වූයේ,
1. සෙලෙට්වරු 2. සමරිතානුවරු 3. පරිසිවරු 4. සද්දුසි වරු 5. හෙරෝදිවරු

50. දිළිඳුන් ලෙස සැලකුණු සමාජයේ පිළිගැනීමකට ලක් නොවූ මොවුන්, කඳු මුදුන්වල, තැනිතලා බිමෙහි දේව නමස්කාරයේ යෙදුණු පිරිසක් විය. එනම්,
1.ධීවරයෝ 2. සමරිතානුවරු 3. එඬේරු 4. අයකැමියෝ 5. කෙරුබ්වරු

2 x 50 = 100

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education NWP

43 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය .............................

# ක්‍රිස්තු ධර්මය II

කාලය පැය තුනයි

වැදගත්

I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

## I කොටස

01.
1. පැරණි මැද පෙරදිග ප්‍රඥා සම්ප්‍රදායයේ නිශ්චිත ප්‍රභේද දෙක නම් කරන්න. (ල. 2)
2. හේබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද හතරක් ලියා දක්වන්න. (ල. 4)
3. ගීතාවලියේ ගීතිකා වර්ගීකරණය පිළිබඳව ඇති මත 3ක් ලියා කෙටියෙන් පහදන්න. (ල. 6)
4. ගීතාවලිය යාච්ඤාව පිළිබඳ නිධානයකි. ගීතාවලිය ජන වන්දනාව සඳහා භාවිතය පිළිබඳ උදාහරණ හතරක් දක්වමින් කෙටියෙන් පහදන්න. (ල. 8) (මුළු ල. 20)

02.
1. මෙසියානු සංකල්පය පිළබඳ කරුණු දක්වන දිවැසිවරු දෙදෙනෙකු නම් කරන්න. (ල. 2)
2. යෙසායා දිවැසිවරයා දක්වන මෙසියස් වහන්සේගේ සුලක්ෂණ හතරක් ලියන්න. (ල. 4)
3. දිවැසි ඉගැන්වීමේ තේමා තුන කෙටියෙන් හඳුන්වන්න. (ල. 6)
4. දිවැසි කැඳවීමේ විශේෂ ලක්ෂණ මොනවාදැයි දක්වා ඔබ කැඳවීමට ප්‍රතිචාර දක්වන ආකාර දෙකක් විස්තර කරන්න. (ල. 8) (මුළු ල. 20)

03.
1. ගිවිසුම් වල පොදු ලක්ෂණ දෙකක් දක්වන්න. (ල. 2)
2. ගිවිසුම යන්නට හේබ්‍රෙව් වචනය දක්වා එහි අරුත ලියන්න (ල. 4)
3. දස පණතෙහි ලක්ෂණ 5ක් ලියන්න. (ල. 6)
4. ඉශ්‍රායෙල් ජනතාව ගිවිසුම සඳහා සූදානම් වූ ආකාරය දක්වා ඔබ දිවිය තුළ එම ගිවිසුම පිළිගැනීම මගින් සිදුකරන ක්‍රියා 4ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 8) (මුළු ල. 20)

## II කොටස

04. 1. දිව්‍යසිවර ඉගැන්වීමේ මෙසියානික සංකල්පය විමසමින් ඔබ මෙසියානික සංකල්පය සමාජයට ඉදිරිපත් කරන්නේ කෙසේදැයි කරුණු 5කින් විස්තර කරන්න. (ල. 10)

2. ජෙරමියා දිව්‍යසිවරයා යවනු ලබන්නේ නව බලාපොරොත්තු ඇති කිරීමටය. මේ ඇසුරු කර ගෙන ඔබ ජීවිතයේ හමුවන බලාපොරොත්තු බිඳ වැටීම් වලදී ක්‍රියා කරන ආකාරය කරුණු 5කින් දක්වන්න. (ල. 10)

05. 1. එලෝහිම් සම්ප්‍රදායේ ඒක දේව වාදය රැකීමේ නියමුවා වන්නේ රජතුමා නොව දිව්‍යසිවරයා ය. මෝසෙස් තුමාගේ කැඳවීම ඔස්සේ එය සනාථ කරන්න. (ල. 10)

2. අද ඔබට ලැබෙන දිව්‍යසි කැඳවීම පිළිගෙන ක්‍රියා කරන්නේ කෙසේදැයි කරුණු 5කින් විමසන්න. (ල. 10)

06. 1. සීනයි ගිවිසුම මගින් සුවිශේෂී ජනතාවක් බවට පත්වූ ඉශ්‍රායෙල් ජනතාව ලද ත්‍රිවිධාකාර සම්බන්ධය විමසමින් එම තත්ත්වය ඔබට අයිති කර ගත හැක්කේ කෙසේදැයි කරුණු දෙකකින් විස්තර කරන්න.(ල. 10)

2. වර්තමාන සමාජය හා පාසල තුළ ඔබ ගිවිසුමින් බැඳුණු ජනතාවක් මෙන් ක්‍රියා කරන ආකාර 5ක් නිදර්ශන සහිතව පැහැදිලි කරන්න. (ල. 10)

07. 1. ප්‍රඥාව යන්න විමසමින් ප්‍රඥා සාහිත්‍ය යේ ආරම්භය කරුණු 5කින් විස්තර කරන්න (ල. 10)

2. ප්‍රඥාව යනු යහපත්ව දෙවියන් වහන්සේට ප්‍රසන්නව ජීවත් වීමයි. ඔබ එසේ ජීවත් වන්නෙ කෙසේදැයි කරුණු 5කින් විස්තර කරන්න. (ල. 10)

08. 1. ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ පලස්තීනයේ ජනතාව අතර විවිධ තරාතිරම් මත පදනම් වූ සමාජ රටාවක් පැවති බවට ජන කණ්ඩායම් 5ක් ගෙන විස්තර කරන්න. (ල. 10)

2. එදා ක්‍රිස්තුන් වහන්සේ පලස්තීනයේ පැවති තරාතිරම් බලා කටයුතු කිරීම ප්‍රතික්ෂේප කරන ලදි. මේ පිළිබඳ සලකා බලා අද සමාජයේ එම අසාධාරණයට විරුද්ධව ඔබ කටයුතු කරන ආකාරය කරුණු 5 කින් විස්තර කරන්න. (ල. 10)

# දෙවන වාර පරීක්ෂණය - 2020
# ක්‍රිස්ත්‍රියානි ධර්මය - 12 ශ්‍රේණිය.
# I පත්‍රය - පිළිතුරු

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 03 | | 11 | 05 | | 21 | 04 | | 31 | 01 | | 41 | 03 |
| 02 | 05 | | 12 | 02 | | 22 | 04 | | 32 | 04 | | 42 | 05 |
| 03 | 02 | | 13 | 01 | | 23 | 04 | | 33 | 01 | | 43 | 03 |
| 04 | 05 | | 14 | 04 | | 24 | 03 | | 34 | 02 | | 44 | 01 |
| 05 | 01 | | 15 | 05 | | 25 | 02 | | 35 | 04 | | 45 | 03 |
| 06 | 01 | | 16 | 01 | | 26 | 05 | | 36 | 03 | | 46 | 04 |
| 07 | 05 | | 17 | 01 | | 27 | 01 | | 37 | 03 | | 47 | 05 |
| 08 | 01 | | 18 | 03 | | 28 | 03 | | 38 | 03 | | 48 | 02 |
| 09 | 03 | | 19 | 01 | | 29 | 05 | | 39 | 04 | | 49 | 01 |
| 10 | 03 | | 20 | 01 | | 30 | 03 | | 40 | 05 | | 50 | 03 |

(ලකුණු 2 x 50 = 100යි.)

## 2 පත්‍රය 1 කොටස

01. 1. පැරණි ගිවිසුමේ සෙබයිට් ප්‍රඥාව (Sebayt), මෙසපොතේමියානු (විනයධරයන්) ගේ ප්‍රඥාව
(ලකුණු 1 x 2 = 2යි.)

2. පවුල හා ගෝත්‍රික ප්‍රඥාව (Family or Tribal Wisdom), රාජ්‍ය සභාව හා ප්‍රඥාව (Court Wisdom), අභිධාර්මික ප්‍රඥාව (Reflective or Philosophical Wisdom)
එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥා ආකල්ප (ප්‍රායෝගික ප්‍රඥාව) (Practical Wisdom) (ලකුණු 2 x 2 = 4යි.)

3. 1. 1.ප්‍රශංසා ගීත 2. විලාප ගීත 3. තුති දීමේ ගීතඃ 4 ප්‍රඥා ගීත 5 රාජකීය ගීත
6 සියොන් ගීත හෙවත් වන්දනා ගීත 7 විශ්වාසයේ ගීත. (ලකුණු 2x3 = 6යි.)

4. 12 ශ්‍රේණිය ගුරු අත්පොත 82-83 පිටු වල ඇති උදාහරණ
1. ඉශ්‍රායෙල් ජනතාවගේ සමිඳාණන් වහන්සේගේ මනහර ක්‍රියා හෙවත් විශ්වය මැවීම, ඉතිහාසයෙහි බලවත් ලෙස මැදිහත්වීම සම්බන්ධ අත්දැකීම් ආදියට ප්‍රතිචාරයක් වශයෙන් ප්‍රශංසා ගී නිර්මාණය කර ඇත.
2. මිනිසාගේ අබල දුබලකම් හේතු කොට ගෙන ඇති වන විවිධ කටුක අත්දැකීම් හා මරණය සම්බන්ධයෙන් උන් වහන්සේට කන්නලව් කිරීම,
3. ගීතාවලිය ඉශ්‍රායෙල් ජනතාවගේ ජන ජීවිතය තුළ දෙවි සමිඳාණන් වහන්සේ ව අත්දුටු බවට ඇති හොඳම සාක්ෂියකි.
4. ගීතාවලියෙහි සඳහන් ගීතිකා ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයේ විශේෂ අවස්ථාවන් හි දී ද උන්වහන්සේගේ ඉගැන්වීම්වල දී ද භාවිත කර ඇත. උදාහරණ ලෙස කන්ද උඩ දේශනාවේදී කුරුස ගසේදී
5. අද පවා අපගේ යාච්ඤා වලදී ගීතාවලියෙහි ගීතිකා ආශ්‍රයෙනි.
6. ජන වන්දනාවේ උතුම්ම අංගයක් වූ දිව්‍ය පූජාවේ දී ද දේව වචනයට පිළිතුරක් ලෙස යොදා ගනුයේ ගීතාවලියෙන් ගන්නා ලද විවිධ ගීතය. මේ කරුණු සහිතව සිසුවා ලියා ඇති පිළිතුර අනුව ලකුණු පිරිනමන්න. (ලකුණු 2 x 4 = 8යි.)

02. I. යෙසායා , සෙකරියා , මීකා
2. 1. අසිරිමත් උපදේශකයාණෝ ය 2. ප්‍රතාපවත් දෙවිතුමාණෝ ය 3. සදාතන පියාණෝ ය
4. සාමයේ කුමාරයාණෝ ය -

III. 1. ඒක දේව වාදය, සදාචාරය,මෙසියානු සංකල්පය (12 ශ්‍රේණිය ගුරු අත්පොත 68 පිටු
(එක් බයිබල් පාඨයක් උදාහරණ ලෙස ලියා තිබිය යුතුය.)

IV. 1. දේව දර්ශනය හෝ විශේෂ අත්දැකීම 2. දූත මෙහෙවර පැවරීම 3. කැඳවීම භාර ගැනීමට දිවැසිවරයා මැලි වීම 4. දෙවියන් වහන්සේ විසින් දිවැසිවරයා ධෛර්යවත් කරනු ලැබීම 5. දිවැසිවරයා යවනු ලැබීම යන කරුණු සහිතව සිසුවා ලියා ඇති පිළිතුර අනුව ලකුණු පිරිනමන්න.

03. I. 1. දෙපාර්ශවයේ ම එකඟතාව මත කොන්දේසි ස්ථාපිත කිරීම.
2. කොන්දේසි සුරැකීම පිණිස දෙවි කෙනෙකු සාක්ෂි දැරීම.

2. ''ගිවිසුම" යන්නට හෙබ්‍රෙව් වචනය ''බරිත්'' ය. එහි අරුත නම් දෙපාර්ශවයක් අතර ඇතිකර ගන්නා එකඟතාවයක් යන්න ය. එය කොන්දේසි මත පදනම් වූ ද්වි පාර්ශ්වික සබැඳියවකි

3. 1. විධායක නීති පද්ධතියකි.
2. නිශේධාත්මක නීති 8 කි. (''නොකළ යුතු'')
3. ප්‍රතිශේධාත්මක නීති 2 කි. (''කළ යුතු'')
4. සර්වකාලීන නීති පද්ධතියකි. (සෑම කාලයට ම ගැළපෙන)
5. දෙවි-මිනිස් සහ මිනිස් - මිනිස් සබඳතාවය ගොඩනැගීමට දායක වෙයි

04. (12 ශ්‍රේණිය ගුරු අත්පොත 64පිටුව කරුණු සහිතව) සිසුවා ලියා ඇති පිළිතුර අනුව ලකුණු පිරිනමන්න.

**2 කොටස**

04. I. ජුදා ජනතාවගේ බලාපොරොත්තු වන කේන්ද්‍රය වූයේ මෙසියස් වහන්සේය. හෙබ්‍රෙව් බසින් "මෂියාහ්"ලෙසද ග්‍රීක බසින් "ක්‍රිස්ටොස්" ලෙස ද මෙසියස් වහන්සේව හඳුන්වයි. එහි අර්ථය "ආලේප කරනු ලැබූතැනැත්තා යන්නයි. පුරාණ ගිවිසුමෙහි පූජක වරු ද රජවරු ද දිවැසිවරු ද ආලේප කරනු ලැබුවෝ වෙති.මේ ත්‍රිවිධ කාර්යයන් ඒකරාශී වී මෙසියස් වරයාණන් තුළින් ප්‍රකාශ වන බව ඔවුන්ගේ විශ්වාසය විය. ජුදා සංකල්පයට අනුව මෙසියස් වහන්සේ පැමිණෙන්නේ දෙවියන් වහන්සේගේ රාජ්‍යය හෙවත් ආධිපත්‍යය ලොව තුළ ස්ථාපිත කිරීමට නිසා තමන්ට පැමිණෙන සියළු දුක් කරදර ඔවුන් ඉවසා සිටියේ අනාගත සෞභාග්‍යය ගැන සිහි කරමිනි.

පළමුවන මෙසියානික දිවැස් වැකිය නාතාන් දිවැසිවරයා දාවිත් රජුට ප්‍රකාශ කරයි. (2 සාමුවෙල් 7:10-17)
1. මෙසියස් තුමා දාවිත්ගේ පරපුරෙන් පැමිණෙන්නේ ය.
2. උන් වහන්සේගේ රාජ්‍යය දෙවියන් වහන්සේගේ රාජ්‍යය වන බැවින් එය සදාතනික ය.
3. මෙම රාජ්‍යය තුළ යුක්තිය, ධර්මිෂ්ඨකම හා සාධාරණත්වය ක්‍රියාත්මක වන හෙයින් එය සාමයේ රාජ්‍යයක් වන්නේ ය.

එම්මානුවෙල් ලකුණ (යෙසායා 7 :10-17)
අනාගත සාම රජාණෝ (යෙසායා 9,1-7)
සාම රාජ්‍යය (යෙසායා 11:1-9)

ඉශ්‍රායෙල්ට අධිපතියෙක් (මීකා 5:1-4) ඉහත කරුණු ඇසුරින් ලියා ඇති සිසු පිළිතුරු අනුව ලකුණු දෙන්න. (12 ශ්‍රේණිය ගුරු අත්පොත 68-70 පිටු ) (ලකුණු 10 යි.)

II. ජෙරමියා දිවැසිවරයා දක්වන නව ගිවිසුම පිළිබඳ දක්වමින් ලියා ඇති සිසු පිළිතුරු අනුව ලකුණු දෙන්න.(12 ශ්‍රේණිය ගුරු අත්පොත 73-74පිටු) (ලකුණු 10යි.)

05. I. එලෝහීන් සම්ප්‍රදාය අනුව මෝසෙස්ව ඉදිරිපත් කරන්නේ ප්‍රාතිහාර්ය පාන දිවැසිවරයෙකු ලෙසය. මෝසෙස්තුමාගේ කැඳවීම ඉදිරිපත් කරන්නේ ද දිවැසිවරයෙකු ලෙසය. (නික්මයාම 3:1-4:17) දිවැසිවරයා කැඳවීමේ ලක්‍ෂණ 05 මෝසෙස්තුමාගේ කැඳවීම හා ගලපා පිළිතුර ලියන්න.
(12 ශ්‍රේණිය ගුරු අත්පොත පිටු 53 -54)

II. කාලෝචිතව ලියා ඇති කරුණු වලට ලකුණු දෙන්න.

06. I. අ) දෙවියන් වහන්සේටම අයිති සම්පත වීම.
ආ) පූජක රාජ්‍යයක්
ඇ) කැපවූ (ශුද්ධ වූ) ජාතියක් වීම. (12 ශ්‍රේණිය ගුරු අත්පොත 63-64පිටු) දක්වමින් ලියා ඇති සිසු පිළිතුරු අනුව ලකුණු දෙන්න.

II. ප්‍රසාද ස්නාපනය මඟින් ගිවිසුම් ජනතාවට එකතු වන අතර ඒ තුල දෙවියන් වහන්සේගේ සම්පත බවට පත්වීම.පූජක කැපවූ ශුද්ධ ජාතියක් වීම.සත්‍යයට සාක්ෂි දැරීම.දේව විශ්වාසය තුල දෙවියන් වහන්සේ කෙරෙහි බලාපොරොත්තුව තුල ජීවත් වීම. අන් අය වෙනුවෙන් කැපවීම වැය වීම. සහජීවනයෙන් ක්‍රියා ශීලීව කටයුතු කිරීම( කාලෝචිතව ලියා ඇති කරුණු වලට ලකුණු දෙන්න.)

07. I. ප්‍රඥා සාහිත්‍යය(12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය පිටු අංක 78-79)
II. ප්‍රඥාව හඳුන්වා ( කාලෝචිතව ලියා ඇති කරුණු වලට ලකුණු දෙන්න.)
(12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය පිටු අංක 78-79)

08. I. (12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය පිටු අංක 85-91)
II. පවුකරුවන්ට කාන්තාවන්ට වැන්දඹුවන් රෝගීන්ට සමරිතානුවන්ට දුගීන්ට හා අසරණයන්ට ක්‍රිස්තුන් වහන්සේ දැක්වූ දයාව විමසමින් කාලෝචිතව ලියා ඇති කරුණු වලට ලකුණු දෙන්න.

**අවසාන ලකුණ ගණනය කිරීම : 1 පත්‍රය - 100 2 පත්‍රය - 100**

**අවසාන ලකුණු 200 - 2- 100**



LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
GUIDE PAST PAPERS
G.C.E. O/L
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440